# **2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්හට**
# **මූල්‍යමය සහන ප්‍රදානය කිරීම සඳහා වන යෝජනා ක්‍රමය**

1. **මූල්‍යමය සහන සඳහා වන ප්‍රතිඥාව**

වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල් වෙනුවෙන් මූල්‍යමය වන්දි ප්‍රදානය කිරීම හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති මාලාව යටතේ හඳුන්වා දී ඇති මැදිහත්වීම් අටෙන් (08) එකක් (01) වේ. එසේවුව ද, මරණයක් සිදු වීම හේතුවෙන් පවුලේ සාමාජිකයකු අහිමිවීමක් වෙනුවෙන් හෝ පෙර පරිදි ආදායම් ඉපයීමට නොහැකි වීම ඇතුළුව නැවතත් සාමාන්‍ය ජීවිතයක් ගෙවීමට නොහැකි වන පරිදි සිදු වූ තුවාලවීමක් වෙනුවෙන් ලබා දෙනු ලබන කිසිදු මුදලකින් ඒ සිදු වූ අහිමිවීම හෝ හානිවීම පියවිය නොහැකි බව පිළිගනී. එමනිසා හානිපූරණය යන විෂයපථය තුළ ප්‍රදානය කරනු ලබන මූල්‍යමය සහන යනු මෙකී වින්දිතයන්ට මුහුණ පෑමට සිදු වී ඇති තත්ත්වයන්ගෙන් මිදීම සඳහා වන සුළු වශයෙන් හෝ කරනු ලබන සහාය දැක්වීමකි.

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ SCFR අංක 163/2019, 165/2019, 166/2019, 184/2019, 188/2019, 191/2019, 193/2019, 195/2019, 196/2019, 197/2019 සහ 293/2019 දරන නඩුවල තීන්දුව වන "හානිපූරණ කාර්යාලයේ වින්දිත අරමුදලක් ස්ථාපිත කළ යුතු අතර, වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල් වෙත වන්දි ලෙස නියම කරන ලද මුදල් පිරිනැමීම සඳහා සාධාරණ සහ අපක්ෂපාතී වන්දි යෝජනා ක්‍රමයක් සකස් කළ යුතු ය" යන්නට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් මෙම යෝජනා ක්‍රමය සකස් කරන ලදී.

2. **යෝජනා ක්‍රමය "සාධාරණ සහ අපක්ෂපාතී" බව සහතික කිරීමට උපයෝගී කර ගත හැකි මූලධර්ම**

අ. වින්දිත කේන්ද්‍රීයතාව - මූල්‍යමය සහන ප්‍රදානය මූලික වශයෙන්ම වින්දිතයන්ගේ අවශ්‍යතා මත පදනම් වේ.

ආ. ප්‍රමුඛත්වය ලබා දීම - නොපමාව ලබා දිය යුතු හානිපූරණයන් අවශ්‍ය වන වඩාත් අනාරක්ෂිත වින්දිතයන්ගේ (ආබාධ සහිත තැනැත්තන්, වැඩිහිටි පුද්ගලයන්, ළමුන්, කාන්තාවන්) අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

ඇ. සහන දෙනු ලබන ප්‍රමාණය - වින්දිතයින් සඳහා වන අරමුදලෙහි ඇති මුදල් ප්‍රමාණය මත පදනම්ව එක් එක් වින්දිතයාට/ පවුලට ලබා දිය යුතු සහන ප්‍රමාණය තීරණය කරනු ලැබේ.

3. **ක්‍රමවේදය**

අ. මූලික වශයෙන් පහත පුදගලයන් සඳහා අවශ්‍යතා ඇගයීමක් සිදු කරනු ඇත-

- i. ජීවිත අහිමි වූ තැනැත්තන්ගේ පවුල්; සහ
- ii. පූර්ණ කාලීනව ආබාධිතබවට පත් වූ තැනැත්තන්

ආ. වැඩිදුර සහන ලබා ගැනීමට අපේක්ෂා කරන වින්දිතයන්ගේ කැමැත්ත ලබා ගැනීමෙන් අනතුරුව ඔවුන් සඳහා අවශ්‍යතා ඇගයීමක් සිදු කරනු ඇත.

ඇ. ඇගයුම් කිරීමට සහභාගී වීමට ඇති කැමැත්ත මත පදනම්ව, අඛණ්ඩව පවතින අවශ්‍යතා ඇගයීමට ලක් කරනු ඇත.

4. **යෝජනා ක්‍රමය**

අ. අවශ්‍යතා ඇගයීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක-

- i. ආබාධ සහිත තැනැත්තන්ගේ වෛද්‍ය අවශ්‍යතා (දිගු කාලීන සහ කෙටි කාලීන). අවශ්‍ය අවස්ථාවල දී, වෛද්‍ය අවශ්‍යතාවන් ඇගයීම සඳහා වෛද්‍ය නිලධාරියෙකුගෙන් වෘත්තීය උපදෙස් පැතීම.
- ii. මියගිය පවුලේ සාමාජිකයාගෙන් යැපුණු යම් වැඩිහිටි තැනැත්තෙක් වේ නම් ඔහුගේ/ ඇයගේ අවශ්‍යතා
- iii. ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා
- iv. කාන්තා ගෘහමූලික පවුල් ඇතුළුව නොපමාව සැපිරිය යුතු අනෙකුත් අවශ්‍යතා ඇති පවුල්

ආ. වින්දිතයන් සඳහා වන අරමුදලෙහි පවතින මුදල් මත පදනම්ව මූල්‍යමය සහන ප්‍රමාණය තීරණය කරනු ලැබේ.